# Sannasa Sports

කොහෙද මනුස්සයෝ මෙච්චර කල් වහන් වෙලා හිටියෙ. අපි හැමතැනම බැලුවා, මොනවා හරි කරදරයකවත් පැටලිලා ද කියලා.

අනේ නෑ නෑ ජගිරි මහත්තයා එහෙම දෙයක් නෙමෙයි, පොඩි නිවාඩුවකට ගම් පැත්තෙ ගිහින් එන්න කියලා ගියා..

ඒ කිව්වෙ, සිරි ලංකාවට ද?

නැතුව ඉතිං වෙන කොහේ යන්නද ජගිරි මහත්තයො..

අනෙ අම්මපා, ඇහුවොත් අතේ සතේ නෑ.. ඒ වුණාට මාස දෙකේ තුනේ ටුවර් ගහන්නෙ..

සල්ලි තිබිලා නෙමෙයි ජගිරි මහත්තයො, අර ප්ලාස්ටික් කාඩ් එකේ පිහිටෙන් ගියේ.. දැන් ඉතිං අව්ව, වැස්ස නොබලා, නින්ද, නොනින්ද නොබලා ක්ලීනික් පාරක් දාලා කොහොම හරි ඒක ගෙවන්න වෙනවා..

මම දන්නැතුවය උඹෙ තරම.. ලංකාවට ගිහිල්ලා සුද්දා වගේ කාඩ් එකෙන් බොරු වැඩ පෙන්නන්න ඇති එහේ ඉන්න අහිංසකයින්ට.. දැන් ඉතිං මුළු ඔස්ට්‍රෙලියාවම සුද්ද පවිත්‍ර කරන්න වෙයි උඹට ඕක ගෙවලා ඉවර කරන්න.. ඒකෙන් වැඩක් නෑ.. කොහොමද ලංකාවෙ ක්‍රීඩා තොරතුරු එහෙම??

ක්‍රීඩා කිව්වට ලංකාවෙ තියෙන්නෙ එකම ක්‍රීඩාවයිනෙ කතාබහ කරන්න.. ක්‍රිකට්නෙ.. ඒකත් පිකල් ජගිරි මහත්තයො..

පිකල් කිව්වෙ, අපබ්‍රංස නැතුව කියාපන්කො..

පිකල් කිව්වෙ ජගිරි මහත්තයො අච්චාරු.. ආරංචි ඇතිනෙ මං නොකිව්වට.. අර්ජුනව ක්‍රිකට් මහ පුටුවෙන් ඇදලා දැම්මා බලුකුක්කෙකු වගේ.

අපිටත් ආරංචියි.. කවුද අප්පා ඒ අපරාධය කෙරුවේ..?

කවුද ඉතිං.. ලොකු තමයි. ලොකු කිව්වෙ, ඇමතිතුමා ද??

මිනිහට පුළුවන්ද එච්චර හපන්කමක් කරන්න...

මිනිහට බෑ තමයි.. ඒත් මිනිහගෙ පස්සෙන් මහ ලොකු හිටියා ඇහැක් වහගෙන දන්නෑ වගේ, ලොකුට වැඩේ බාර දීලා..

මහා ලොකු කිව්වෙ අපේ අධිපති තුමා ද?

වෙන කවුද? මොකද ඕයි අර්ජුන ළමයා ඔය පුටුවට ආපු ක්‍රමය හරි නෑනේ.. මහා ලොකුට පාර්ට් එක දාලා කිව්වා මට ක්‍රිකට් මහ පුටුව නැත්නම් අනිත් පැත්තට ඡන්දෙ දෙනවා කියලා.. ඒ පාර මහා ලොකු කිව්වා, අපෙ අප්පේ එහෙම කරන්න එපා, මෙන්න පුටුව මල්ලි කියලා.. දීලා ටික කාලයක් පුටුව උඩ පිනුම් ගහන්න ඇරියා..

# ක්‍රිකට් පිකල්

ඇයි පංදුක එහෙම කියන්නෙ.. මිනිහා පුටුව උඩ පිනුම ගැහුවෙ නෑ.., ක්‍රිකට් වලට සේවයක් කළා නේද??

කළා, කළා.. අපෝයි ඔව්.. වර්ල්ඩ් කප් එක දිනපු දා ඉඳලා අයියලා, මල්ලිලා සේරම එකතු කරගෙන පුළුවන් තරම් හැදුවා ක්‍රිකට් පිකල්.. පහු-ගිය දවස් වල ටීම් එකේ කොල්ලො ටිකත් එක්ක අච්චාරුවක් දාගත්තා.. ඊට පස්සෙ ඉන්දියාවෙ කිරිකට් ලොක්කො ටිකත් එක්ක පිකල් පාරක් දාගත්තා.. ලොකු එක්ක හැමදාමත් වලි. අම්පයර්ලට පාර්ට් එක දාලා මුරලි බෝරගත්තු තියරියම තමයි හැම තැනම දාන්න හදන්නෙ.. අයියා පාර්ට් වලින් පාලනය කරන්න බෑ ජගිරි මහත්තයා හැම එකක්ම.. ටිකක් හරි පාලනයක් දැනගෙන තියෙන්න ඕන .. එහෙත් මෙහෙන් අයියා පිකල් පාරවල් වැඩි කරන කොට තමයි මහා ලොකු හිතුවෙ දැන් වෙලාව හරි කියලා.. ඔය අයියලා සේරම යටයි දකුණෙ කට්ටඩියන්ගෙ ගුරුකම් වලට..

අනේ උඹයි, මමයි දන්න පරිපාලනය .. දැන් ඉතිං ඔය අර්ජුන ළමයගෙ පුටුවට කාවද පත් කෙරුවෙ?

අලුත් ලොක්කව නම් ජගිරි මහත්තයලා හොඳට දන්නවත් ඇති.. ඒ කාලේ හිටපු හොඳ දඟ පන්දු යවන්නෙක්.. ඩී.ඇස්. ද සිල්වා කියලා..

එවර පැත්තක සිටි සංක්‍රමන මහත්තයා සුපුරුදු පරිදි මැදට පැන්නෙ අපායට ගහන කැලැන්ඩරයට පරිදි මුව සරසා ගෙනය.

මොකද බං අපි දන්නෙ නැත්තෙ ඩී.එස් ද සිල්වව.. එතන නෙමෙයි ප්‍රශ්නය තියෙන්නෙ.. ඔය ක්‍රිකට් පාලක මණ්ඩලයෙ ව්‍යවස්ථාවෙ තියෙනවා නේද, සූදු ඔට්ටු ව්‍යාපාර වලට සම්බන්ධ අයට එම මණ්ඩලයෙ තනතුරු දැරීම තහනම් කියලා වගන්තියක් .. ඩී.ඇස්. ද සිල්වා කියන්නෙ ඒ කාලෙ දඟ පන්දු යැව්වට, මේ කාලෙ ලංකාවෙ තියෙන ලොකුම සූදු ඔට්ටු ව්‍යාපාරයක ඉහළම තනතුරක් දරන කොටස්කරුවෙක්නෙ..

ඒ වුණත් සංක්‍රමන මහත්තයෝ.. ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ව්‍යවස්ථාපිත නීතියේ බලපෑම නිසා ක්‍රිකට් පාලක මණ්ඩලයේ ව්‍යවස්ථාවේ මිළ සූන්‍ය වෙනවා..

මොකද්ද පංදුක ඒ හරුපෙ තේරුම? මොකද්ද ඒ නීතිය? ..

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාලක පක්ෂයේ අධිපතිතුමාට හෝ එම පක්ෂයේ බලවතුන්ට හෝ ශ්‍රී ලංකා රජයට හෝ රජයට සම්බන්ධ ආයතනයකට යම් කෙනෙක් පත් කිරීමේදී,

(අ) අවම සුදුසුකම්වත් සපුරාලීම අවශ්‍ය නැත.



(ආ)දූෂණ වංචා වලට සම්බන්ධව සිටීම නුසුදුසුකමක් නොවන්නේය.
(ඇ) එසේ පත් කරන අය එම ආයතනයෙ නීතිය ක්‍රියාත්මක කිරීමට බැඳී නොමැත.

ඔන්න ඕකයි සංක්‍රමන මහත්තයො සහසුද්දෙන්ම රටේ ක්‍රියාත්මක වෙන නීතිය.

ඒක යකාගෙ නීතියක්නෙ... එතකොට මිනිස්සු උසාවි යයිනෙ.. උසාවි ගියා කියලා වැඩක් නෑ සංක්‍රමන මහත්තයො.. ශ්‍රී ලංකා ජනරජයේ තවත් නීතියකින් එවැනි අවස්ථා වලදී රටේ පුරවැසියන් ආරක්ෂා කිරීමට පියවර ගෙන තිබෙනවා..

කියාපන් බලන්න පංදුක.. ඒ නීතියත් අපිට දැනගන්න..

ශ්‍රී ලංකා රජයේ අධිකරණයකින් ලබා දෙන ඕනෑම තීන්දුවක් ක්‍රියාත්මක කිරීමේ හෝ නොකිරීමේ හෝ වෙනස් කිරීමේ අයිතිය (මෙලෙස) ශ්‍රී ලංකා ජනරජය සතුවනු ඇත.

(කික්ම තමයි,.. සංක්‍රමන මහත්තයට තරහ ගිහින් වගෙ.. ඉක්මණින් මාරු වෙන එක ඇඟට ගුණයි..)

පංදුක අර හදනවයි කිව්ව ක්‍රිකට් පිකල් එකට උඹවත් දාලා දිය කරන්න හිතෙනවා මට.. කරුණාකරලා උඹෙ ඔය නීති පොතත් අරන් පුළුවන ඉක්මණින් මෙතනින් චුත වෙලා පලයන්..

පංදුක බිලිංකම

# සංක්‍රමණිකයකුගේ සටහන

## සුනාමි, ගින්දර සහ අපි

වෝන්ලා, මැග්‍රලා ඇතුළු ඔසී කට්ටියට අපි කොහොම දොස් කිව්වත් සුනාමියට මුහුද ගොඩ ගලපු වෙලාවෙ මෙරට වැසියෝ අපට උදව් කළ හැටි අපිට අමතක කරන්න පුළුවන්ද? ලංකාවට ආධාර යවන්න පාරේ, කැට වලට මුදල් එකතු කරපු අපේ කට්ටිය ඒකට සාක්ෂි දරාවි. ජාතිය, පාට මොනවා වුණත් මනුස්සකම කියන්නෙ ඒකටයි. ඒකට කොහොමද අපේ කට්ටිය ප්‍රතිචාර දක්වපු හැටි අවස්ථාවක් ආ විටදී. අපි කියන්නෙ හැමෝටම නෙමෙයි. ඒත් පොදුවේ මේ දේ කිව යුතුමයි. ලැව් ගින්නෙන් විපතට පත් වූවන්ට සහන සැලසීමේ වැඩපිළිවෙලට උපකාරී වීමට ශ්‍රී ලංකාව වෙනුවෙන් අරමුදල් රැස් කිරීමේ පරමාර්ථයෙන් සංවිධානය කරපු උත්සවයට අපේ කට්ටියගේ පැමිණීම කොහොමද? අන්තිමයි. රටක් හැටියට කෘතගුණ සැළකීමට අපට ලැබුණු අවස්ථාවෙන්, අපි නියම විදිහට ප්‍රයෝජන ගත්තද? කණගාටු ය. කීයක් හරි කොහේට හරි දෙනවට වඩා අපේ හැඟීම පෙන්වන්න තිබුණු අවස්ථාවක් ඒක. ඇත්තටම අපි ඒක මග හැරියා. පෙරදිග සංස්කෘතික උරුමයන් ගැන කටින් පාරම්බෑවට වැඩක් නැහැ, ඒවා තිබිය යුත්තේ හදවත් තුළයි.

## Young Talent

වැඩිහිටියන් සහ කුඩා දරුවන් සමඟ වැඩ කරන එක පහසුයි. මන්ද පොඩි ළමයි කියන විදිහට කරන නිසා හා වැඩිහිටියෝ අවබෝධයෙන් යමක් කරන නිසා. ඒත් ගැටව් එක්ක වැඩ කරන එක පහසු නැත. තරුණයන් එක අරමුණකට ගේන එක ලේසි නැහැ. ගෙනාවත් ඉක්මණින් කඩා බිඳ දාගෙන යනවා. යෞවනය එහෙම තමයි. අපි හැමෝම ඒක දන්නවා. හොඳ ගමනක් යන්න හදන පිරිසකගෙ හොඳ උත්සාහයක් ලෙස ---- නම් කරන්න පුළුවන්. තරුණයෝ පන්නරය ලබන්න නම් මොනවම හරි කරන්න ඕනේ. මේකට සම්මාදන් වුණ උදවියගේ මහන්සිය අපතේ ගිහින් නැහැ. මෙල්බර්න් වල කලාවේ අනාගතය ඇත්තේ මොවුන් දැතේය. ඔවුනට එය බාර දීම සඳහා හොඳ පෙරහුරුවක් මෙයින් ලැබුණා. අඩුපාඩු ප්‍රශ්නයක් නැහැ. වටින්නේ උත්සාහයයි. ඔබේ ප්‍රයත්නයට අපේ සුබ පැතුම්!!

## රොමෑන්ටික් සැඳෑව

ගීතය කියන කලා මාධ්‍යය විවිධ හැලහැප්පීම් වලට ලක්වෙමින් ඉදිරියට ඇදෙන වකවාණුවක තමයි අපිට කසුන් කල්හාර ගේ ගී රටාව විඳගන්න ලැබුණෙ. භාරතීය ආභාෂයෙන් ලැබුණ හික්මීම සහ සීමාවන් ඔස්සේ ඉදිරියට ඇදුන අපේ සංගීතයේ සීමා ඉවුරු බිඳගෙන ගිය නව පරම්පරාවක් පසුගිය දශක සීමාව තුළ අපි දැක්කා. අක්මුල් නැති නිර්මාණ ෆැක්ටරි වලින් බිහි වූ සංගීත සම්ප්‍රදායන්හි ප්‍රතිඵල තවමත් අපි විඳිමින් ඉන්නේ. අතරින් පතර හොඳ නිර්මාණකරුවන් බිහි නොවුණාම නොවේ. ඒ අතරින් තම සීමාවන් හොඳින් දැන අවබෝධයෙන්, නව තාක්ෂණය හා බටහිර නාද රටාහි ආභාෂය මැනවින් සංකලනය කොට අපට නිර්මාණ පුදන කලාකරුවෙක් ලෙසයි, ඔහු අපට වටින්නේ. ඔහු ගැනත්, ඒ සංගීතය ගැනත් අපි දන්න නිසා ඒ ග ැන මේ ඇති. කොහොම වුණත් එදා ප්‍රසංගය බලන්න ගිය වෙලේ දැණුනෙ දැඩි සතුටක්. ඒ සංගීතයෙ මිහිර මෙන්ම පැමිණ සිටි ප්‍රේක්ෂකයන්ගේ ප්‍රමාණය නිසා. නව නිර්මාණකරුවෙකුගේ මෙහෙය උදෙසා නොපැකිලව බර පැන දැරීම පිළිබඳව න්දී ඇතුළු ස්වෝන්ලාට අපේ ප්‍රසාදය..!

## අමා දහර

නව සංස්කෘතියක් තුළ වැඩෙන අපේ දරුවන් පෙරදිග සංස්කෘතික අංග කෙරෙහි යොමු කිරීම වෙනුවෙන් මෙල්බර්න් නැටුම් ආචාර්යවරුන් කරනු ලබන්නේ සුවිශාල කැප කිරීමකි. ළමුන් පුහුණු කර ප්‍රසංගයක් දක්වා ගෙන ඒම පහසු කටයුත්තක් නොවේ. මෙල්බර්න් නැටුම් ගුරුවරුන් අතර අමා සිරිවර්ධන සුවිශේෂී වන්නේ ඇගේ නිර්මාණ බොහෝ විට බටහිර නාද රටා හා සමගාමීව යන නිසයි. මේ සංස්කෘතිය තුළ ඉන්න දරුවන්ට ගෝචර වන්නේද එවැනි නිර්මාණ විය හැකිය. අමා දහර ජනප්‍රිය වීමේ එක් හේතුවක්ද එයම විය යුතුයි.